රාජ්‍ය තාන්ත්‍රික වීසා.

ශ්‍රී ලංකා හෝ මාලදිවයින් රාජ්‍ය නිලධාරීන් හෝ සුදුසුකම් ලත් ජාත්‍යන්තර සංවිධාන වල සාමාජිකයන්

ශ්‍රී ලංකා හෝ මාලදිවයින් රාජ්‍යයන් වෙනුවෙන් නිල කටයුතු සඳහා යන හෝ කොළඹ වෙනත් තානාපති කාර්යාල වල හෝ සුදුසුකම් ලත් ජාත්‍යන්තර සංවිධාන වල සේවය කරන අයට හෝ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ කොන්සියුලර් අංශයට තම වීසා සඳහා කෙලින්ම අයදුම් කළ හැකිවේ. ඒ අයට අදාල වීසා වර්ග වන්නේ A (රාජ්‍ය නිළධාරීන්) හා G (සුදුසුකම් ලත් ජාත්‍යන්තර සංවිධාන වල සේවකයින්) වේ. අයදුම්කරුවන් තම සංවිධානයෙන් රාජ්‍ය තාන්ත්‍රික ලිපියක් සමග ඔවුන්ගේ රැකියාව හා සංචාරයේ අරමුණ පිළිබඳ අදාල තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. ශ්‍රී ලංකාවේ හෝ මාලදිවයිනේ නේවාසික රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර ඇති අයටද මෙම ක්‍රියාපිළිවෙල යටතේ එක්සත් ජනපද තානාපති කාර්යාලයට කෙලින්ම අයදුම් කළ හැකිය.

A හා G වීසාවක් ලබාගැනීම සඳහා ඔබේ සබඳතා තොරතුරු ඇතුලත් ලිඛිත ඉල්ලීමක් ඔබේ DS-160 තහවුරු කිරීමේ පත්‍රය සමග කොන්සියුලර් අංශයට ෆැක්ස් කරන්න. (94-11-249-8590) වැඩකරන දින දෙකක් ඇතුලත කොන්සියුලර් අංශය ඔබ අමතනු ඇත. ඔබ A හෝ G වීසාවක් සඳහා සුදුසුකම් ලබා ඇත්නම් හෝ රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් ඇත්නම් ඔබේ වීසා සඳහා කිසිම ගාස්තුවක් ගෙවීම අවශ්‍ය නොවේ. A හා G වීසා පිළිබඳව ඔබට විමසීමක් කිරීමට අවශ්‍ය නම් ඉහත සඳහන් ෆැක්ස් අංකයෙන් එක්සත් ජනපද තානාපති කාර්යාලය අමතන්න.

රාජ්‍ය තාන්ත්‍රිකයන්ගේ ගෘහ කාර්ය මණ්ඩලය (A-3 හා G-5 වීසා)

ගෘහ සේවක අයදුම්කරුවන් පහත සඳහන් දෑ සැපයිය යුතුය.

1. සේවා යෝජකයා එක්සත් ජනපදයට පැමිණි දිනය
2. සේවා යෝජකයාගේ එ.ජ. වීසාවේ පිටපතක් - සේවා යෝජකයාගේ එක්සත් ජනපදයේ රැකියාව විදේශ දූත මණ්ඩල කාර්යාලයේ (OFM) කළමණාකරණ තොරතුරු පද්ධතියේ (TOMIS) හි වාර්තා වී තිබිය යුතුය.
3. රාජ්‍ය සම්බන්ධතා චාරිත්‍රවලට අනුව විදේශ දූත මණ්ඩලය හෝ ජාත්‍යන්තර සංවිධානය විසින් විදේශිකයෙක්, ගෘහ සේවකයෙක් හෝ පුද්ගලික සේවකයෙකු ලෙස බඳවා ගැනීමේ අභිප්‍රාය ගැන දැනුම් දීම අවශ්‍ය වේ. විදේශ දූත මණ්ඩල කළමණාකරණ තොරතුරු පද්ධතියේ (TOMIS) මෙවැනි පූර්ව දනුම්දීම් සටහනක් අඩංගුවන තුරු A-3 හෝ G-5 වීසාවක් නිකුත් නොකෙරෙනු ඇත.
4. සේවා යෝජකයා එක්සත් ජනපදයෙන් පිටවීමට අපේක්ෂිත දිනය
5. දැනට රැකියාවේ නියුතු අනිකුත් ගෘහ සේවකයන්ගේ නම් හා වීසා තොරතුරු
6. එක්සත් ජනපදයේ මීට පෙර සේවය ලබාගත් ගෘහ සේවකයන්ගේ නම් හා වීසා තොරතුරු

7. එක්සත් ජනපද නීති වලට අනුව ගෘහ සේවකයාට ගෙවීම් කළ බවට හා වර්තමාන කාර්ය මණ්ඩලයට අවශ්‍ය වේතන ගෙවීමට සේවා යෝජකයාට සම්පත් ඇති බවට සාක්ෂි
8. රැකියා ගිවිසුම පිළියෙළ කළ පුද්ගලයා හෝ ව්‍යාපාරය පිළිබඳ සාක්ෂි
9. ගෘහසේවක අයදුම්කරුගේ වැඩ ඉතිහාසය හා චරිත සහතික ලිපි.
10. සේවා යෝජකයා හා අයදුම්කරු විසින් ඔහුට කියවිය හැකි භාෂාවකින් අත්සන් කරන ලද එක්සත් ජනපද කම්කරු නීතිවලට අනුකූලවන රැකියා ගිවිසුම

මෙම තොරතුරු සැපයීමට අසමත් වීම හෝ කලින් සේවයට යොදාගත් ගෘහ සේවකයන් පිළිබඳ ගැටළු තිබීම සැලකිය යුතු ප්‍රමාදයකට හේතුවිය හැක. අවශ්‍ය තොරතුරු TOMIS පද්ධතියට ඇතුල්කිරීමට සන්ධාන අංශය සමග සම්බන්ධීකරණය කිරීම, සේවා යෝජකයා හෝ ඔහුගේ හෝ ඇයගේ සංවිධානයේ වගකීම වෙයි.